# A Comparative Study of the *Yōgācāra* Idealist Attitude and Parallel Teachings on the Doctrine of Dependent Origination

## හේතු ප්‍රත්‍ය ධර්මතාව පිළිබඳ යෝගාචාර විඥානවාදි ආකල්පය හා සමයාන්තර ඉගැන්වීම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්.

Karapikkada Sobitha

**පර්යේෂණ ගැටලුව**

යෝගාචාර හේතු ප්‍රත්‍ය න්‍යාය දර්ශනය හා සමයාන්තර ඉගැන්වීම් කෙතෙක් දුරට සම විෂම වේ ද ?

**හැඳින්වීම**

සෑම බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායයක්ම ස්ව පදනම වශයෙන් ගෙන ඇත්තේ හේතු ප්‍රත්‍ය ධර්මතාවය හෙවත් ප්‍රතීත්‍ය සමුප්පාද න්‍යායයි. ඒ මත පදනම් ව සියලු දාර්ශනික සම්ප්‍රදායයන් තම චින්තනයන් ඉදිරිපත් කොට ඇති අතර, එයට හේතුව වනුයේ හේතුඵල න්‍යායෙන් තොරව කිසිදු දාර්ශනික මතවාදයකට පදනමක් නොවන බැවිනි. එමෙන් ම බුදුදහමේ මූලික පදනම වන්නේ ද ප්‍රතීත්‍ය සමුප්පාද ඉගැන්වීමයි. යෝගාචාර විඥානවාදීන්ට ද හේතුඵල න්‍යාය දර්ශනයෙන් තොරව ස්ව ඉගැන්වීම් ඉදිරිපත් කිරීමේ අසම්පූර්ණත්වය අවබෝධ වී තිබිණි. විඥානය මූලික වූ ඔවුන්ගේ ඉගැන්වීම් ද හේතුඵල සමාවේෂයක් තුළ හසුරුවන්නට ඔවුන් උත්සුක වී ඇත්තේ එබැවිනි. අපගේ මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් යෝගාචාර විඥානවාදී ප්‍රතීත්‍ය සමුප්පාද න්‍යාය විග්‍රහය හා එය අනෙකුත් සමයාන්තර ඉගැන්වීම් තුළින් සුවිශේෂ වන්නා වූ පදනම පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනය කරනු ලබයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

- මූලාශ්‍රය අධ්‍යයනය

**සාකච්ඡාව**

යෝගාචාර විඥානවාදී දර්ශනයට අනුව "විද්‍යමානත්වය" යනු හේතු ප්‍රත්‍ය මගින් සකස් වෙමින් ද, ඇති වෙමින් ද, පවතින්නා වූ සංස්කාරයෝ ය. මෙම පිළිගැනීම යෝගාචාර දර්ශනයේ මෙන් ම මධ්‍යමක ශුන්‍යතාවාදයේ ද එක සේ පෙන්වා දී ඇති නමුදු, යෝගාචාරීන්ගේ ප්‍රතීත්‍ය සමුප්පාද විග්‍රහය ස්ථවිරවාද, සෞත්‍රාන්තික, සර්වාස්තිවාද, සම්මිතීය වැනි බෞද්ධ ගුරුකුලයන් හා අන්‍යව විග්‍රහ වී ඇත. මහාමති බෝසත් තෙමෙ බුදුරදුන් සමීපයේ සියලු ධර්මයන්ගේ හේතු ප්‍රත්‍ය ලක්ෂණයන් දේශනා කිරිම අපේක්ෂා කළහ. සත්-අසත් දෘෂ්ටි විකල්පයෙන් විපරීත නොවීම පිණිස බුදුරදුන් මෙහි දී ප්‍රතීත්‍ය සමුප්පාද ධර්මය දක්වා ඇත. ආර්ය ලංකාවතාර සූත්‍ර දේශනාවට අනුව යෝගාචාර සම්ප්‍රදායානුගත ප්‍රතීත්‍යසමුප්පාද දේශනාව "හේතු" "ලක්ෂණ" වශයෙන් ද්වි ප්‍රකාර වේ. එනම් බාහ්‍ය හෙවත් බාහිර ප්‍රතීත්‍යසමුප්පාද ධර්මය හා ආධ්‍යාත්මික ප්‍රතීත්‍යසමුප්පාදය යනුවෙනි.

මෙහි බාහිර ප්‍රතීත්‍ය සමුප්පාදය යනු කිසියම් බාහිර හේතු සාධක, උපක්‍රම නිසා අප අවට බාහිර ලෝකයේ හටගන්නා වූ බොහෝ දේ පිළිබඳ ධර්මතාවයි. ඒ තුළ බාහිර ලෝකයේ ඇත, පවතී, තිබේ යැයි හැගෙන, දැනෙන, පෙනෙන සියල්ල අන්‍යාකාරක, අන්‍යහේතුක, අන්‍යසාධක ලෙසින් නිර්මාණය වන බව දක්වා ඇත. යම් සේ මැටි පිඩක්, කෙවිටක්, රෝදයක් (චක්‍ර), පටියක් (සූත්‍ර), ජලය (උදක),

මිනිසකුගේ උත්සහය ආදි හේතු මගින් ඝටයක් හෙවත් කලයක් හටගැනේ ද, එමෙන්ම නූල් වලින් වස්ත්‍රයක් ද, පන්වලින් පැදුරක් ද, බීජයෙන් අංකුරයක් ද, හැඳිගෑම ආදි මිනිස් උත්සහයෙන් මී කිරි වලින් ගිතෙල් ද නිර්මාණය වේ. මෙම සියල්ල බාහිර සාධක අන්‍යෝන්‍ය ලෙස ප්‍රත්‍යව නිර්මාණය වන්නා වූ ධර්මයෝ ය.

මෙහි දැක්වෙන්නා වූ අභ්‍යන්තර හෙවත් ආධ්‍යාත්මික ප්‍රතීත්‍ය සමුප්පාදය යනු අවිද්‍යාව, තෘෂ්ණාව, කර්මය ආදිය නිසා නිර්මාණය වන්නා වූ ස්කන්ධ, ධාතු, ආයතන ආදි ධර්මයන්ගේ ස්වභාව විග්‍රහයයි. මෙම ඉගැන්වීම අන් කිසියම් වූ හෝ බෞද්ධ සම්ප්‍රදායාගත ඉගැන්වීමක් තුළ දැකිය නොහැකි විග්‍රහයකි. එසේම එය යෝගාචාර සම්ප්‍රදායට පමණක් සුවිශේෂී වූවකි. මෙහි දැක්වෙන්නා වූ ආධ්‍යාත්මික ධර්ම වන ස්කන්ධ, ධාතු, ආයතන ආදීහු අවිද්‍යාව, තෘෂ්ණාව, කර්ම බලය ප්‍රත්‍යව නිර්මාණය වේ. මෙසේ හේතු ප්‍රත්‍යව නිර්මාණය වන්නා වූ ධර්මතාවන් තුළ යෝගාචාරීහු සත්‍ය බවක් අවධාරණය නොකළ ද, අනෙකුත් ධර්මවාදී සම්ප්‍රදායානුගතීහු  බාහිර ලෝකය සත්‍ය, නිත්‍ය යැයි නොසළකා මෙම ස්කන්ධාදි ධර්මයෝ පමණක් සත්‍ය ලෙස පිළිගනිති. ***"තේ ච අවශිෂ්ටාඃ කල්පයන්තෙ බාලෛඃ"*** යනුවෙන් ලංකාවතාර සූත්‍රයේ දැක්වෙන්නේ එසේ ඉතිරිව පවත්නා වූ නිත්‍ය ධර්ම පිළිබඳ අනුවන බාලයන් සළකන බවයි.

මෙසේ බාහිර ප්‍රතීත්‍ය සමුප්පාදය හා ආධ්‍යාත්මික ප්‍රතීත්‍ය සමුප්පාදය යථා පරිදි අවබෝධ කොට නොගැනීම නිසා ත්‍රෛකාලීන, ත්‍රෛධාතුක පැවැත්ම "ඇත" හා "නැත" යනුවෙන් අනුවන බාලයන් විසින් පරිකල්පනය කෙරෙන බව මෙහි දී තව දුරටත් විග්‍රහ වී ඇත. එසේ ම යෝගාචාරීන්ගේ මතය වනුයේ ත්‍රෛකාලීන ධර්ම පිළිබඳ "ඇත" හෝ "නැත" යනුවෙන් ගැනීම දෘෂ්ටි ග්‍රාහකයක් බවයි. මෙහි ධර්මයන්ගේ අස්තිත්වය පිළිබඳ දෘෂ්ටි ග්‍රාහකය වනුයේ යමෙක් පරමාර්ථ සත්‍ය ලෙස විද්‍යමාන ලෝකය නැතැයි සළකා එහි හේතු ප්‍රත්‍ය ධර්ම අනුව ලෝකය ඇතැයි සැළකීමයි. (***විද්‍යමානෛර් හේතුප්‍රත්‍යයෛර් ලෝක උත්පද්‍යතේ***) බීජයක් නිසා ගසක් හටගැනීම විද්‍යමානව පෙනෙන්නා වූ හේතු ප්‍රත්‍යයකි. එකී විද්‍යමාන හේතු ප්‍රත්‍ය ඉන්ද්‍රියයන්ට විෂය ගෝචර වන නිසාම විද්‍යමාන හේතු ප්‍රත්‍යයන් කරණකොට ගෙන ලෝකයක් ඇත' යන පිළිගැනීමට සියලු පුහුදුන් මිනිසෙක් ම ඇතුලත් වේ. මෙයින් "ඇත" යන දෘෂ්ටි ග්‍රහනයට වැටේ.

ථෙරවාදය, සර්වාස්තිවාදය ඇතුළු ධර්මවාදිහු හේතු ප්‍රත්‍ය පදනම්ව ධර්මයන්ගේ අස්තිත්වය අවධාරණය කොට ඇත. නමුත් යෝගාචාරීහු එය ද දෘෂ්ටි ග්‍රාහකයක් ලෙස දක්වති. පුද්ගලයා විද්‍යමාන වූ හේතු ප්‍රත්‍ය සැළකිල්ලට ගනිමින් අත්දැකීම් වශයෙන් "ඇත" යනුවෙන් ලෝකයක් පරිකල්පනය කරන ආකාරයෙන්ම විද්‍යමාන නොවන්නා වූ හේතු ප්‍රත්‍ය සැළකිල්ලට ගෙන ලෝකයක් "නැත" යනුවෙන් පරිකල්පනය කරයි. මෙහි විද්‍යමාන නොවන්නා වූ හේතු-ප්‍රත්‍ය යනු ක්ලේෂ මූලික අකුසල් සිත් ය. එනම් රාග, ද්වේෂ, මෝහ ආදි සිතිවිලිය. එවැනි අකුශල මූලික ක්ලේෂ සිතුවිලි පවත්නා බව දැනගෙන, පසුව ඒවාට පිවස ගැනීමට ඉඩ නොදීමෙන් හෙවත් එකී ක්ලේෂයන්ට නොඑලඹීමෙන් ලෝකයක් නොපවතින්නේ යැයි පරිකල්පනය කිරීමයි. මෙසේ පරිකල්පනයක යෙදීමෙන් එවන් වෛනාශික හෙවත් ඉන්මතු නොපවතින තත්ත්වයට පත්වෙයි. එවිට විද්‍යමානත්වයක් නැත' යන පිළිගැනීම සිදු වේ. යෝගාචාරීන්ට අනුව මෙය ද දෘෂ්ටි ග්‍රාහයකි. ඔවුහු මෙම දෘෂ්ටි ද්වයෙන්ම මිදී ස්ව ප්‍රතීත්‍ය සමුප්පාද විග්‍රහය දක්වන අතර, ඒ තුළ තම අනන්‍යතාව තහවුරු කොට ඇත.

**නිගමනය**

යෝගාචාරින්ගේ මෙම ප්‍රතීත්‍ය සමුප්පාද න්‍යාය දර්ශනය තුළ "ඇත" "නැත" යන අන්තද්වයම ප්‍රතික්ෂේප වන අතර, ඒ තුළින් ඔවුහු ධර්ම අස්තිත්වය මෙන් ම ධර්ම නෛරාත්මය ද බැහැර කොට දක්වා ඇත. එබැවින් සමයාන්තර බෞද්ධ චින්තනයන් තුළ විග්‍රහ වන්නා වූ ප්‍රතීත්‍ය සමුප්පාද විවරණයන්ට සාපේක්ෂකව යෝගාචාරීන්ගේ ප්‍රතීත්‍ය සමුප්පාද විවරණය තුළ පැහැදිලි වෙනසක් දැකිය හැකිය.

**ප්‍රමුඛ පද;** විඥානය, හේතු, ලක්‍ෂණ, දෘෂ්ටි, ක්ලේෂ

## ආශ්‍රිත ග්‍රන්ථ

විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය, වසුබන්ධු (විංශතිකා), ස්ථිරමති (ත්‍රිංශතිකා), අනුවාදක ඥානසීහ හිමි, හේන්පිටගෙදර, ඇම්. ඩී. ගුණසේන, කොළඹ, 1964.

නානායක්කාර, සනත්, (2003) මුල් බුදු දහමේ සිට වජ්‍රයානය දක්වා. සරල හැඳින්වීමක්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල.

මේධානන්ද හිමි, දේවාලේගම, (1992) චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්, ආරිය මුද්‍රණ, වරකාපොල.

ලංකාවතාර සූත්‍රය, (2002) (පරි) ධර්මසිරි, ගුණපාල, වයි. එන්. මුද්‍රණ.

විජේසිංහ, එස්. ඒ. ජී. (2002) නිර්වාණය සහ ශූන්‍යතාව, සමයවර්ධන.

විජේසිංහ, එස්. ඒ. ජී. (2000) යෝගාචාර විඥානවාදී මහායාන දර්ශනය, ඇස්. ගොඩගේ.